# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2060/3 - 2018 පෙබරවාරි මස 26 වැනි සඳුදා - 2018.02.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/10/52/2012

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

අංක 2041/21 දරන හා 2017.10.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් අම්බලන්ගොඩ, මහඅම්බලන්ගොඩ, දෙල්දූව පාර, අංක 59හි පදිංචි එස්. එච්. හේමපාල මයා ඇතුළු සේවකයින් දහසය (16) දෙනා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A3517 දරන හා 2017.08.11 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් එස්. එච්. හේමපාල මහා ඇතුළු සේවකයින් දහසය (16) දෙනා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A3517 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2018.10.19 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 පෙබරවාරි මස 05 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

පළමුවන උපලේඛනය

"ආ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : එස්. එච්. හේමපාල ඇතුළු
සේවකයින් දහසය (16) දෙනා
අංක 59, දෙල්දූව පාර,
මහඅම්බලංගොඩ, අම්බලංගොඩ

දිනය : 2017.12.29

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය.

2017.10.19 දිනැති අංක 2041/21 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූ ද එස්. එච්. හේමපාල ඇතුළු සේවකයන් දහසය (16) දෙනා සහ ලංකා විදුලිබල මණ්ඩලය බැඳී සිටින්නාවූ ද, 2017.08.11 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. එච්. හේමපාල ඇතුළු
සේවකයින් දහසය (16) දෙනා.

පිටපත : (අනෙක් පාර්ශ්වය)
ලංකා විදුලිබල මණ්ඩලය.

03-552


1 A – G 27205— 14 (2018/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*